www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාව: නැගෙනහිර පලාතේ මැතිවරන ප්‍රෝඩාව

## Sri Lanka: Election charade in eastern province

**සරත් කුමාර විසිනි**
**2008 මැයි 9**

යුද්ධයෙන් විනාශයට පත් නැගෙනහිර ශ්‍රී ලංකාවේ සෙනසුරාදා පැවැත්වීමට නියමිත පලාත් සභා මැතිවරනය වනාහි, සිය මිලිටරි වාඩිලෑම ප්‍රජාතන්ත්‍රවාදී වහන්තරාවකින් වසා ගැනීමට කොලඹ ආන්ඩුව දරන ප්‍රයත්නයකි. පැරා-මිලිටරි තමිල් මක්කල් විඩුතලෙයි පුලිකල් (ටීඑම්වීපී) සංවිධානය සමග ආන්ඩුව තනා ගෙන ඇති සන්ධානය ද ඡන්දදායකයන් බියවැද්දීම පිනිස හමුදාව හා පොලීසිය දැවැන්ත පරිමානයෙන් යොදවා තිබීම ද මගින් මැතිවරනයේ සැබෑ ස්වභාවය එලිදරව් වේ.

නැගෙනහිර පලාත් සභාවක් නිර්මානය කිරීම ම ප්‍රකෝපකාරී පියවරකි. ශ්‍රී ලංකාවේ පලාත් සභා මුලින්ම පිහිටුවන ලද්දේ රටේ සිවිල් යුද්ධය අවසන් කරනු පිනිස ගෙන ආ 1987 ඉන්දු-ලංකා ගිවිසුමේ කොටසක් ලෙස 13 වන ව්‍යවස්ථා සංශෝධනය යටතේ ය. දෙමල නිජභූමියක් පිලිබඳව දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය කල ඉල්ලීමට දුන් සහනයක් ලෙස උතුරු හා නැගෙනහිර පලාත් එක පලාතක් බවට ඒකාබද්ධ කරන ලදි.

සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක පදනම මත 2006 ඔක්තෝබරයේ දී ශ්‍රේෂ්ඨාධිකරනය විසින් එම ඒකාබද්ධ පලාත යලි වෙන් කරන ලදි. එම තීන්දුව දෙනු ලැබුවේ. 2002 සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශ අල්ලා ගැනීමේ ආක්‍රමනික මෙහෙයුම් දියත් කරන ලෙස අන දීම මගින් ජනාධිපති මහින්ද රාජපක්ෂ දිවයින යලි විවෘත යුද්ධයට ඇද දැමීමෙන් යන්තම් මාස කිහිපයකට පසුව ය.

ඒකාබද්ධ පලාතට යම් ආකාරයක ස්වයං-පාලනයක් දීම යුද්ධය අවසන් කිරීමේ සාකච්ඡාවලට කේන්ද්‍රීය කාරනාවක් ලෙස පැවති බැවින්, මෙම අධිකරන තීන්දුව, ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයේ මිනී පෙට්ටියට තවත් ඇනයක් ගැසීමක් විය. රාජපක්ෂ ආන්ඩුව අධිකරනයේ නඩුව සඳහා මූලිකත්වය ගත්තේ නැති වුවත්, එය එම පෙත්සමට විරුද්ධ වීමට කිසිදු පියවරක් ගත්තේ නැත. ජවිපෙ ආකාරගත ලෙස පාර්ලිමේන්තුවේ විපක්ෂයේ සිටියත් ආන්ඩුව නොවැටී පවත්වා ගෙන යාමෙහි ලා එහි පාර්ලිමේන්තු සහයෝගය ප්‍රධාන සාධකයක් ලෙස පැවතී ඇත.

2006 පටන් ශ්‍රී ලංකාවේ මිලිටරිය එල්ටීටීඊයට එරෙහිව නැගෙනහිර පලාත තුල සාපේක්ෂව පහසු ජයග්‍රහන මාලාවක් ලබා ගෙන ඇත. එයට බොහෝ සෙයින් හේතු වූයේ කලින් කරුනා කන්ඩායම ලෙස ප්‍රසිද්ධ ටීඑම්වීපී සන්නද්ධ කන්ඩායමෙන් ලැබුනු සහයෝගය යි. මෙම පැරා-මිලිටරි කන්ඩායම 2004 දී එල්ටීටීඊය තුල හටගත් භේදයකින් මතු වූ අතර එහි දී එල්ටීටීඊයේ නැගෙනහිර සටන්කරුවන්ගෙන් දහස් ගනනක් එයින් බිඳුනි. වී. මුරලිදරන් හෙවත් කරුනා විසින් නායකත්වය දෙන ලද මෙම කන්ඩායමේ වත්මන් නායකයා වන්නේ එස්. චන්ද්‍රකාන්තන් හෙවත් පිල්ලෙයාන් ය.

ටීඑම්වීපී සංවිධානය ප්‍රාදේශීය ජනතාව ත්‍රස්ත කිරීමෙහි ලා මිලිටරිය සමග වූ එහි සහ-ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නැගෙනහිර පලාත තුල කුප්‍රකට වන අතර ඝාතන හා පැහැර ගැනීම් ගනනාවකට එය සම්බන්ධ බවට පුලුල් ලෙස විශ්වාස කෙරෙයි. මාර්තු මස පැවති නැගෙනහිර පලාතේ මඩකලපු දිස්ත්‍රික්කයේ පලාත් පාලන මැතිවරනයේ දී ද මෙම කන්ඩායම රාජපක්ෂගේ එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) සමග සන්ධානගතව තරග කලේ ය. එම මැතිවරන ව්‍යාපාරය, විශේෂයෙන් ම විපාර්ශ්වික අපේක්ෂකයන්ට එරෙහිව එල්ල කෙරුනු පුලුල්ව පැතිරුනු බියගැන්වීම් හා ප්‍රචන්ඩ ක්‍රියා මාලාවක් මගින් අතිශයින් දූෂිතව පැවතුනි.

නිදහස් හා සාධාරන මැතිවරනයක් පැවැත්වීම පිලිබඳ රාජපක්ෂගේ කියාපෑම ප්‍රෝඩාවකි. නැගෙනහිර පලාතේ දිස්ත්‍රික්ක තුනෙහි -- ත්‍රිකුනාමලය, මඩකලපුව හා අම්පාර -- විශාල ප්‍රදේශ යුද්ධයෙන් මෙන් ම 2004 දෙසැම්බර් සුනාමියෙන් ද විනාශයට ලක්ව තිබේ. ත්‍රිකුනාමලය හා මඩකලපු දිස්ත්‍රික්කවල කලින් එල්ටීටීඊ පාලනයට නතුව තිබූ කොටස් අල්ලා ගැනීමට හමුදාව ගෙන ගිය ආක්‍රමනික මෙහෙයුම්වල ප්‍රතිඵලයක් ලෙස 5,000ක් ජීවිතක්ෂයට පත්ව 200,000කට වැඩි පිරිසකට සිය නිවාස අහිමි වූ බවට තක්සේරු කෙරෙයි.

බොහෝ දෙනෙක් සිය නිවාස කරා යලි පැමිනීමට නොහැකිව සරනගත කඳවුරුවල හෝ සිය මිතුරන්ගේ හා ඥාතින්ගේ නිවාසවල තවමත් කල් ගෙවයි. ඔවුන් සිය පෙර ලිපිනවල නොසිටි බැවින් මෙම මැතිවරනය සඳහා නිකුත් කෙරුනු 170,000ක පමන නිල ඡන්ද

පත්‍රිකා ප්‍රමානයක් අදාල ඡන්දදායකයන්ට බෙදා හැරීමට නොහැකි වී ඇතැයි තැපැල්පති පිලිගෙන තිබේ. මෙම සංඛ්‍යාව 980,000ක් වන පලාතේ ඡන්දදායකයන්ගෙන් සියයට 20කට ආසන්න ප්‍රමානයකි. යලි ලියාපදිංචි වන ලෙස මැතිවරන බලධාරීන් කල ඉල්ලීමට ප්‍රතිචාර දක්වා ඇත්තේ 50,000ක් පමන වන අභ්‍යන්තරව අවතැන් වූ ජනයාගෙන් 1,600ක් පමනි.

ආරක්ෂක හමුදාවෝ මෙම පලාත තුල ආධිපත්‍යය දරති. නැගෙනහිර ආඥාපති මේජර් ජෙනරාල් ජම්මික ලියනගේ අප්‍රේල් 23 දා රජය සතු ඩේලි නිව්ස් පත්‍රයට මෙසේ පැවසී යඃ "පොලීසියට අමතරව නැගෙනහිර පලාතේ යොදවා ඇති 20,000ක් වන ශක්තිමත් ආරක්ෂක හමුදාවෝ විශේෂයෙන් ම නැගෙනහිර මැතිවරනය වෙනුවෙන් නැගෙනහිර පලාත තුල ආරක්ෂාව ශක්තිමත් කරනු ඇත." මෙම සංඛ්‍යාව සෑම ඡන්දදායකයන් 49කට ම එක් සොල්දාදුවකු යෙදීමට සමාන ය. මැතිවරන කාල පරිච්ඡේදය තුල දී අමතර භට කන්ඩායම් 40ක් යොදවනු ඇති බව ද ලියනගේ තව දුරටත් පැවසී ය.

12.000ක පොලිස් නිලධාරීන් පිරිසක් -- මෙය කලින් එහි සිටි ප්‍රමානය මෙන් දෙගුනයකි -- මෙන් ම 6,000ක පමන ග්‍රාමාරක්ෂක භටයන් ද පලාත තුල යොදවනු ඇත. ග්‍රාමාරක්ෂකයන් යනු මිලිටරිය හා පොලීසිය සමග සමීපව ක්‍රියාත්මක වන සිවිල් ආරක්ෂක බලකායකි. ටීඑම්වීපී සන්නද්ධ භටයෝ ආයුධ රැගෙන යාම දිගට ම කරන අතර ඔවුන්ගේ බියගැන්වීම් වැඩෙන තතු යටතේ පවා එම කන්ඩායම නිරායුධ කරන ලෙස විපාර්ශ්වයේ පක්ෂ විසින් කරන ලද ඉල්ලීම ආන්ඩුව හා මිලිටරිය ප්‍රතික්ෂේප කර තිබේ. විපාර්ශ්වික එක්සත් ජාතික පක්ෂය (එජාප), ටීඑම්වීපී ප්‍රචන්ඩ ක්‍රියා පිලිබඳ භීතිය හේතු ලෙස දක්වමින් මඩකලපු දිස්ත්‍රික් මැතිවරනය තරඟ කලේ ද නැත.

ටීඑම්වීපී 2004 දී එල්ටීටීඊයෙන් භේද වූයේ, 2002 සටන් විරාමයේ ප්‍රතිඵලයක් ලෙස ලැබුනු සුලු වරප්‍රසාදවලින් වැඩි කොටස "උතුරේ නායකයන්" ඩැහැ ගෙන ඇති බවට කෙරුනු කටුක චෝදනා මධ්‍යයේ ය. එල්ටීටීඊයට එරෙහි යුද්ධය තුල දී මිලිටරිය වෙනුවෙන් බොහෝ කැත වැඩකටයුතුවල යෙදීමෙන් පසුව, දැන් ටීඑම්වීපී බලාපොරොත්තු වන්නේ ඒවා වෙනුවෙන් තමන්ට ලැබිය යුතු ගාස්තුව භුක්ති විඳීමට යි. ඉහල ම තනතුර වන මහ ඇමතිකම බලාපොරොත්තුවෙන් තරඟ වදින පිල්ලෙයාන් මෑතක දී සන්ඩේ ලීඩර් පත්‍රයට මෙසේ පැවසී යඃ "එම තනතුර නියාමාකාර ලෙස අයිති විය යුත්තේ දෙමල ජාතිකයෙකුට යි. ආන්ඩුව සමග වැඩ කිරීම මගින් අපිට සංවර්ධනය සහතික කර ගන්න පුලුවන්."

එජනිස ලැජ්ජා විරහිත ලෙස සිය මැතිවරන ව්‍යාපාරය සඳහා රාජ්‍ය සම්පත් යොදා ගනී. ආන්ඩුවේ නියෝජිතයන් මැතිවරන ප්‍රචාරක කටයුතු සඳහා නිල වාහන යොදා ගන්නා බව කොලඹ මාධ්‍ය වාර්තා කර තිබේ. මැතිවරන ක්‍රියාකාරකම්වලට උදව් කරන ලෙස සිය කාර්ය මන්ඩලවලට බල කිරීමට ඇමතිවරුන් විසින් දරනු ලැබ ඇති ප්‍රයත්නයන් සම්බන්ධයෙන් පැමිනිලි ලැබී තිබේ. ආන්ඩුවේ පක්ෂ රජය සතු මාධ්‍ය පුලුල් ලෙස යොදා ගනී. ආන්ඩුවේ පක්ෂවලට රාත්‍රී 9 වන තෙක් මැතිවරන ප්‍රචාරක කටයුතුවල යෙදීමට අවසර දී ඇති නමුත් විපාර්ශ්වයේ පක්ෂ සවස 6න් පසු ප්‍රචාරක වැඩවල යෙදීම පොලීසිය විසින් වලකනු ලැබ ඇත. බෙදා හැර නැති නිල ඡන්ද පත්‍රිකා අනිසි ලෙස යොදා ගැනීම මගින් මැතිවරන වංචා කිරීමේ ඉඩකඩ ගැන ද විපාර්ශ්වයේ පක්ෂ උත්සුකතා පල කර තිබේ.

## යුද්ධයේ පක්ෂය

ආන්ඩුව යුද්ධයේ පක්ෂය ලෙස තමන්ව ප්‍රචාරනය කර ගැනීමක පැහැදිලිව ම යෙදී සිටී. අප්‍රේල් 22 දා උතුරේ යාපන අර්ධද්වීපයේ මුහමලෙයිහි දියත් කල ප්‍රධාන හමුදා ආක්‍රමනික මෙහෙයුමෙහි එල්ලය වූයේ -- අඩු ගනනේ ආශිකව -- එල්ටීටීඊයට එරෙහිව ඉක්මන් ජයග්‍රහන කිහිපයක් වාර්තා කර ගෙන එජනිස මැතිවරන ජයග්‍රහන බලාපොරොත්තු ඉහල දමා ගැනීම යි. සොල්දාදුවන් සිය ගනනක් ජීවිත හානිවලට හෝ තුවාලවලට ලක් කෙරුනු ව්‍යසනකාරී පසුබෑස්මක් බවට පත් වූ මෙම මෙහෙයුම පිලිබඳ මාධ්‍ය ආවරනයට එරෙහිව මිලිටරිය තථ්‍ය වාරනයක් පනවා තිබේ.

නැගෙනහිර පලාතේ දෙහිඅත්තකන්ඩියේ දී පසුගිය සතියේ පැවති මැයි දින රැස්වීමක දී, ජනාධිපති රාජපක්ෂ ජනතාවගෙන් ඉල්ලා සිටියේ මිලිටරියට හා දැන් උතුරේ ගෙන යන යුද්ධයට සිය සහයෝගය පෙන්වනු පිනිස ආන්ඩුවට ඡන්දය දෙන ලෙස යි. "සොල්දාදුවො නැගෙනහිර ජනතාව එල්ටීටීඊයෙ ග්‍රහනයෙන් මුදා ගත්තා, ඒ විදියට ම ඔවුන් උතුරෙ ජනතාවත් මුදා ගන්නවා." යැයි ඔහු පුරසාරම් දෙඩී ය. "ඒත් ඒකට තමුන්නාන්සෙලාගේ උදව්ව අපට අවශ්‍යයි. එම උදව්ව උතුරත් අල්ලා ගන්න ඔවුන්ට ධෛර්‍යය දේවි." ප්‍රධාන විපක්ෂය හෙලා දකිමින් රාජපක්ෂ මෙසේ ප්‍රකාශ කලේ යඃ "යූඑන්පියට දෙන ඡන්දය ප්‍රභාකරන්ට දෙන ජන්දයක්."

යන්තම් 37ක් වන පලාත් සභා ආසන සඳහා අපේක්ෂකයන් 1,342ක් මැතිවරනයට තරඟ වදී. එජනිස, ටීඑම්වීපී හා එජාප මෙන් ම ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය (ශ්‍රීලමුකො), ජවිපෙ හා ඊලම් ජනතා ප්‍රජාතන්ත්‍ර පෙරමුන (ඊපීඩීපී) ද මැතිවරනය තරඟ කරයි.

එජාප සහ ශ්‍රීලමුකො මැතිවරන සන්ධානයක් තනා ගෙන ඇත. දක්ෂිනාංශික එජාපය, එල්ටීටීඊයට සහයෝගය දෙනවා නොව, 1983 දී වර්ගෝත්තමවාදී යුද්ධය ආරම්භ කිරීම ද දශකයකටත් වැඩි කාලයක්

තිස්සේ එය පවත්වා ගෙන යාම ද සම්බන්ධයෙන් වගකිව යුතු ය. යුද්ධයේ ආර්ථික බලපෑම සම්බන්ධයෙන් සංගත ප්‍රභූන් අතර පැවති උත්සුකතා පිලිබිඹු කරමින්, එජාපය 2002 දී එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට සාම සාකච්ඡා ඇරඹූ නමුත් කිසිදු සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කර ගැනීමට කිසිදාක සමත් වූයේ නැත. සාම සාකච්ඡාවල අවශ්‍යතාව ගැන විටින් විට කතා කලත්, මෙම පක්ෂය යුද්ධය යලි ඇරඹීමේ රාජපක්ෂගේ වැඩපිලිවෙල නිහඬව පිලිගෙන තිබේ.

ශ්‍රීලමුකො යනු නැගෙනහිර පලාතේ අම්පාර දිස්ත්‍රික්කයේ වෙසෙන සැලකිය යුතු මුස්ලිම් ජනගහනය අතර සහයෝගී පදනමක් ගොඩනගා ගෙන ඇති වාර්ගික මුස්ලිම් පක්ෂයකි. ටීඑම්වීපී, පලාතේ දෙමල බහුතරය මත පදනම්ව නැගෙනහිර පලාතට ස්වයං-පාලනයක් පිලිබඳ පටු-ප්‍රාදේශීයවාදී ආයාචනයක් මත පදනම් වී ගෙන සිටින අතර, ශ්‍රීලමුකො තර්ක කරන්නේ, අම්පාර දිස්ත්‍රික්කය සඳහා බලය බෙදීමේ ඊටත් වඩා පටු රූපාකාරයක් වෙනුවෙනි. පසුගිය මස පැවති සම්මුඛ සාකච්ඡාවක දී ශ්‍රීලමුකො ප්‍රධාන ලේකම් හසන් අලි ප්‍රකාශ කර සිටියේ, "සාධාරන බලය බෙදා හැරීමේ යාන්ත්‍රනයක් සහිතව මුස්ලිම් බහුතරයක් සහිත ප්‍රදේශ තුල ක්‍රියාත්මක වන මුස්ලිම් ඒකකයක්" තම පක්ෂයට අවශ්‍ය බව යි.

එජාප හා ශ්‍රීලමුකො, සිය මැතිවරන ව්‍යාපාරය තුල දී, ටීඑම්වීපීයේ මැර බලය හා එජනිසයේ ප්‍රජාතන්ත්‍ර විරෝධී විධික්‍රම සම්බන්ධයෙන් ඡන්දදායකයන් අතර පුලුල්ව පැතිර පවත්නා වෛරය ගසාකෑමේ යෙදී සිටී. එය ප්‍රභාකරන්ට සහාය දෙන බවට රාජපක්ෂ කරන චෝදනාවට එජාප පිලිතුරු දෙන්නේ, තමන්ගේ ම වර්ගෝත්තමවාදී චෝදනාවකිනි. එනම්, ආන්ඩුව ටීඑම්වීපී නායක පිල්ලෙයාන්ගෙන් "තවත් ප්‍රභාකරන් " කෙනෙකු නිර්මානය කරන බවට චෝදනා කරමිනි. මෙම පක්ෂ දෙකෙන් එකකට වත් යුද්ධයට හෝ සාමාන්‍ය වැඩ කරන ජනතාව මුහුන දෙන සමාජ අර්බුදයට කිසිදු විසඳුමක් නැත.

ජවිපෙ, මැතිවරනයට අපේක්ෂකයන් ඉදිරිපත් කර තිබුනත්, ආන්ඩුව එය පවත්වන්නේ ඉන්දියාවේ බලපෑම යටතේ යැයි කියමින්, පලාත් සභා මැතිවරනයට විරුද්ධ වී සිටී. ජවිපෙ විරුද්ධ වන්නේ උතුර හා නැගෙනහිර ඒකාබද්ධ පලාතක් ලෙස පවතිනවාට පමනක් නොව, පලාත් මට්ටමේ මොන යම් හෝ බලය බෙදා හැරීමකට ද එය විරුද්ධ ය. ඔවුන් සලකන්නේ එය එල්ටීටීඊයට හා දෙමල සුලුතරයට දෙන ඉවසිය නොහැකි සහනයක් ලෙස ය. 1987 දී ප්‍රථම වරට පලාත් සභා හඳුන්වා දුන් විට, ජවිපෙ එයට ප්‍රතිචාර දැක්වූයේ, ඉන්දු-ලංකා ගිවිසුමට හා ඉන්දියානු හමුදා මැදිහත්වීමට එරෙහි ෆැසිස්ට් උද්ඝෝෂනයක් මගිනි. දකුනු ඉන්දියාවේ දෙමල ජනයා අතර වැඩෙන වෛරයට මුහුන දෙනු ලැබ ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාත තුල දේශපාලන අයිතීන් වෙනුවෙන් යම් බලපෑමක් කර ඇති ඉන්දියාවට එරෙහිව යලිත් වරක් ජාතිකවාදී මනෝගතියක් ඇවිස්සීම මගින් ඡන්ද ගරා ගැනීමට ජවිපෙ බලාපොරොත්තු වේ.

පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශගේ නායකත්වයෙන් යුත් විපරීමතධාරී කන්ඩායමක් පක්ෂයෙන් භේද වීම තුල කුලුගැන්වී ඇති කටුක භේදයකින් ජවිපෙ ම දැන් ඉරිතලා ඇත. වීරවංශ කන්ඩායම යුද්ධය ගෙන යාම පිනිස ආන්ඩුව සමග සමීප සන්ධානයක් තනා ගැනීමට උත්සාහ කරන අතර නැගෙනහිර මැතිවරනයේ දී එජනිසයට ඡන්දය දෙන ලෙස වක්‍රව ඉල්ලීමක් කර ඇත. අප්‍රේල් 29 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී, එජාප හා ශ්‍රීලමුකො එල්ටීටීඊයේ ඉත්තන් බවට ආන්ඩුව කරන හෙලාදැකීම් සමග වීරවංශ එක් වූයේ විපාර්ශ්වයේ පක්ෂවලට උතුර හා නැගෙනහිර යලි ඒකාබද්ධ කිරීමට අවශ්‍ය බවට චෝදනා කරමිනි. වීරවංශගේ සගයකු වන දේශහිතෛෂී ජාතික ව්‍යාපාරයේ (දේජාව) සභාපති ගුනදාස අමරසේකර ප්‍රකාශ කලේ, මැතිවරනය "දේශප්‍රේමීන්" ද එජාප හා ශ්‍රීලමුකො විසින් නායකත්වය දෙනු ලබන" අධිරාජ්‍යවාදී බලවේග" ද අතර පවතින තරඟයක් බව යි.

යුද්ධය හා පිරිහෙන ජීවන මට්ටම් අරබයා වැඩෙන පුලුල් මහජන වෛරයට මුහුන දී සිටින ආන්ඩුව සමග සමීප සබඳතා සඳහා වීරවංශ කර ඇති යෝජනාවට ජවිපෙ විරුද්ධ විය. රාජපක්ෂගේ පිලිවෙත් සමග උවමනාවට වඩා අනන්‍ය වීමක් දැනටමත් බිඳ වැටෙමින් පවතින සිය පක්ෂයේ දේශපාලන සහයෝගී පදනම් තව දුරටත් බාදනය කරනු ඇතැයි ජවිපෙ නායකයෝ බියට පත් වූහ. සිය පක්ෂය ආන්ඩුවෙන් දුරස්ථ කර ගැනීමේ උත්සාහයක් ලෙස, ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක සඳුදා ආන්ඩුවට චෝදනා කලේ, "අතිශයින් ම දූෂිත" මැතිවරනයක් මගින් බලය ඩැහැ ගැනීමේ ප්‍රයත්නයක යෙදී සිටින බවට යි.

ඊපීඩීපී යනු ශ්‍රී ලංකාවේ මිලිටරිය සමග සමීප සහයෝගයකින් ක්‍රියාත්මක වන තවත් දෙමල පක්ෂයක් හා සන්නද්ධ කන්ඩායමකි. කෙසේ වෙතත්, නැගෙනහිර මැතිවරනයේ දී, රාජපක්ෂ, ටීඑම්වීපී සංවිධානයට ප්‍රමුඛතාව දෙමින්, සිය ආන්ඩුවේ සහාග හවුල්කරුවකු වන ඊපීඩීපී තර්‍ය වසයෙන් බැහැර කර තිබේ. නැගෙනහිර ප්‍රාදේශීයවාදය මත පදනම් වන ටීඑම්වීපී, එම පලාත තුල පදනමක් දමා ගැනීමේ ඊපීඩීපී ප්‍රයත්නයන්ට සතුරු ය. ඊපීඩීපී විශාල වසයෙන් පදනම්ව සිටින්නේ උතුරේ යාපන අර්ධද්වීපයේ ය.

එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානයට (ටීඑන්ඒ), කලින් නැගෙනහිර පලාත තුල විශාලතම පාර්ලිමේන්තු නියෝජනය තිබූ නමුත්, එය මෙවර පලාත් සභා

මැතිවරනයට තරඟ වදින්නේ නැත. ආංශික වසයෙන් එම තීන්දුව පදනම් වන්නේ. සිය අපේක්ෂකයන් ටීඑම්වීපී සන්නද්ධ භටයන්ගේ ඉලක්ක බවට පත් වනු ඇති බවට එයට පවත්නා යුක්තියුක්ත භීතිය මත ය. 2005 සිට මේ දක්වා ප්‍රමුඛ ටීඑන්ඒ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගනනාවක් ම ඝාතනයට ලක්ව ඇත. එම ඝාතන සිදු කර ඇති බවට බොහෝ සෙයින් ඉඩ ඇත්තේ මිලිටරිය හෝ ටීඑම්වීපී සංවිධානය යි. පසුගිය වසරේ දී, ටීඑන්ඒ මන්ත්‍රීවරු ගනනාවකගේ ඥාතීන් පැහැර ගෙන ගිය ටීඑම්වීපී සංවිධානය එම මන්ත්‍රීවරු අයවැයට විරුද්ධව ඡන්දය දුන්න හොත් අදාල ඥාතීන් මරා දමන බවට තර්ජනය කලේ ය. සාම සාකච්ඡා හරහා යම් ආකාරයක ස්වයං-පාලිත "දෙමල නිජබිමක්" ලබා ගැනීම පිලිබඳ බලාපොරොත්තු තථ්‍ය වසයෙන් බිඳ දමන උතුර හා නැගෙනහිර වෙන් කිරීමට ද ටීඑන්ඒ බරපතල ලෙස විරුද්ධ ය.

සඳුදා දක්වා වන පසුගිය මාසයක මැතිවරන ප්‍රචාරක ව්‍යාපාරය තුල දී, මැතිවරන ප්‍රචන්ඩ ක්‍රියා 49ක් සිදුව ඇති බවට නිදහස් හා සාධාරන මැතිවරනයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය (පැෆරල්) නම් වූ නිරීක්ෂන කන්ඩායම වාර්තා කලේ ය. එයින් 20ක් ම වාර්තා වී ඇත්තේ ටීඑම්වීපී ආන්ඩුවේ අපේක්ෂක ලැයිස්තුවට නායකත්වය දෙන මඩකලපු දිස්ත්‍රික්කයෙන් වන අතර එයිනුත් බොහෝ පැමිනිලි පවතින්නේ එම සන්නද්ධ කන්ඩායමට විරුද්ධව ය. පැෆරල් සංවිධානය මැයි 4 දා මෙසේ සඳහන් කලේ යඃ "පොලීසියට මෙම සිද්ධීන් ගැන දැනුම් දී ඇතත්, එවන් ක්‍රියාකාරකම් අවසානයකට ගෙන එනු පිනිස කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නැත."

ටීඑම්වීපීයට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට ආන්ඩුව හා ආරක්ෂක හමුදාවන් අපොහොසත් වීම, හෙට පැවැත්වෙන මැතිවරනයට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් හෝ යලි සිවිල් පාලනය පිහිටුවීම සමග මොන ම සම්බන්ධයක් වත් නැති බව පෙන්නුම් කරන පැහැදිලි ම දර්ශකයකි. දිවයිනේ සෙසු ප්‍රදේශවල ද මොන යම් හෝ දේශපාලන විරුද්ධත්වයකට එරෙහිව එවන් ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර යොදා ගැනීමට රාජපක්ෂ ආන්ඩුව නොපැකිලෙනු ඇති බවට එය තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org